**ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ජාතික අයවැය දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 21 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 15,267.51 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 6,902.00 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 8,365.51 ක් හෙවත් සියයට 54.79 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 8,554.03 | 2,350.22 | 6,203.81 | 72.52 |
| මූලධන | 6,713.48 | 4,551.78 | 2,161.70 | 32.20 |
| **එකතුව** | **15,267.51** | **6,902.00** | **8,365.51** | **54.79** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා 20.03.04.00 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 800.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 772.05 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 96.51 ක ප්‍රමාණයක් වී තිබුණි.

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 24001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 5.50 | 5.28 | 3.80 | 4.30 | 27.00 | 19.87 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ අංක 7002/0000/00/0262/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.87,677 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 6000/0000/00/0013/0129/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 20.18 ක් විය.

**2.6 විගණන නිරීක්ෂණය**

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 විසර්ජන ගිණුම

-----------------

අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 1,500.00 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 92 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයන් වී තිබුණි.

### 3.2 ආදායම් ගිණුම

-----------------

දෙපාර්තමේන්තුව විසින් 20.03.04.00 දරන රජයේ නිලධාරීන්ට ලබා දෙන යතුරුපැදි සම්බන්ධ මූලික ගෙවීම් පිළිබඳ ආදායම් ගිණුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 සැප්තැම්බර් 23 දිනැති අංක 2/2014 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, 2014 ජුනි 30 දිනට යතුරු පැදි ලබා ගන්නා නිලධාරීන්ගේ ඉදිරි සේවා කාලය වර්ෂ 1 කට වඩා අඩු නම්, යතුරුපැදි හා ස්කූටර් සඳහා පිළිවෙලින් රු.100,000 ක් හා රු.90,000 ක් බැගින් ගෙවිය යුතුව තිබුණි. එසේ මුදල් ගෙවූ නිලධාරීන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2016 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල දිස්ත්‍රික්ක 02 කට අදාළව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි, අදාළ ආයතන විසින් ද යතුරු පැදි බෙදාදීම පිළිබඳව හා ඉහත කී විස්තර ඇතුළත් ලේඛන පවත්වා නොතිබුණි.

(ආ) 2015 ජුලි 07 දිනැති හා අංක BD/GPS/130/9/14/MC-II දරන පොදු උපදෙස් ලිපිය ප්‍රකාරව ක්ෂේත්‍ර නිලධාරියකු යතුරු පැදි හිමි නොවන තනතුරකට මාරුවීම, සේවයෙන් ඉවත්වීම, සේවය අත්හිටුවීම, නියමිත කාලයට පෙර විශ්‍රාම යාම වැනි අවස්ථාවලදී යතුරු පැදිවලට අදාළ වෙළඳ පොළ වටිනාකම එකවර ගෙවිය යුතුව තිබුණි. එසේ ගෙවීම් කළ පසු අදාළ යතුරුපැදිවල තොරතුරු දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු බව සඳහන් කර තිබුණත්, ඊට අදාළ සියළු තොරතුරු ලැබී තිබේද යන්න පිළිබඳව තහවුරුවක් අදාළ ආයතනවලින් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල යෙදී සිටි නිලධාරීන්, ක්ෂේත්‍ර නොවන රාජකාරීවලට ස්ථාන මාරුවීම, නියමිත කාලයට පෙර විශ්‍රාම ගැනීම, සේවයෙන් ඉවත්වීම හා සේවය අත්හිටුවීම යන හේතූන් නිසා එම යතුරුපැදිවල වටිනාකම වශයෙන් රු.20,175,120 ක් දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම අදාළ තොරතුරු මූල්‍ය කල්බදු ගිවිසුම්වලින් හා පැවරීම්වලින් ඉවත් කිරීම සඳහා අදාළ මූල්‍ය ආයතන හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිය යුතුව තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී එසේ ලැබී තිබුණු රු.20,175,120 ක වටිනාකම අළුතින් ආරම්භ කර තිබුණු තැන්පත් ගිණුමක රඳවා ගෙන තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු අදායම් ගිණුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීකෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණු බැර කිරීම් තුළ 2015 වර්ෂයේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් විසින් යතුරු පැදි දෙක බැගින් ලබාගෙන, පසුව වැඩිපුර ලබාගත් යතුරුපැදියට අදාළව ආපසු ගෙවන ලද මුදල්ද ඇතුළත් බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම වටිනාකම් 2016 අප්‍රේල් 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණි.

(ii) වෙනත් ආදායම් ශීර්ෂවලට අදාළ රු.4,265,694 ක් වූ ආදායම්, මෙම ආදායම් ගිණුමට බැර කර තිබුණු අතර, එම බැර කිරීම් හඳුනාගෙන තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් 2016 අප්‍රේල් 30 දින වන විටත් ඒවා නිවැරදි කර නොතිබුණි.

(ii) වෙනත් දෙපාර්තමේන්තු 02 කින් මෙම ආදායම් ගිණුමට රු.157,020 ක් වැරදි ලෙස බැර කර තිබුණත්, 2016 අප්‍රේල් 30 දින වන විටත් ඒවා නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි.

(iii) නිලධාරීන් ඉවත් වීමේදී ආපසු ගෙවූ මුදල් පොදු තැන්පත් ගිණුමක තැන්පත් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එසේ ලැබී තිබුණු රු.4,758,260 ක් මෙම ආදායම් ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඉ) යතුරු පැදි සඳහා මූලික ගෙවීම් කර තිබුණත්, 2016 අප්‍රේල් 30 දින වන විටත් නිලධාරීන් සංඛ්‍යාව 200 කට ආසන්න ප්‍රමාණයකට එම යතුරු පැදි ලබාදී නොතිබුණු බව විගණනයේදී අනාවරණය විය. ඒ සඳහා 2016 අප්‍රේල් 30 දින වන විටත් මෝටර් සයිකල් මිලදී ගෙන හෝ නොතිබුණි. එසේම, මිලදී ගෙන තිබූ ස්කූටර් 500 ක්ද බෙදා අවසන් කර තිබූ බවට තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------------**

විෂය අංක 24001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මියගිය / විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 14 ක හා වර්ෂ 15 ක කාලයක සිට අයවිය යුතු එකතුව රු.305,622 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් විවිධ පියවරයන් ගෙන තිබුණද, එම ණය මුදල් 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.307,599 ක් වූ ණය ශේෂයන් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනිමට කටයුතු කර නොතිබුණු අතර ඉන් එක් ණය ශේෂයක් වර්ෂ 06 කට වඩා වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි.

**3.4 අග්‍රිම ගිණුම**

------------

2015 දෙසැම්බර් 31 දින වන විට පැවති රු. 87,677 ක ශේෂය තුළ 2008 වර්ෂයේදී නිලධාරියෙකු වෙත ලබා දුන් රු. 83,325 ක් වූ විදේශ ගමන් අත්තිකාරම් මුදලක් ඇතුලත්ව තිබුණු අතර එම අත්තිකාරම් සම්ලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.5 බේරුම් නොකළ බැරකම්**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ විසර්ජන ගිණුමේ බැරකම් ලෙස එකතුව රු.5,352,812 ක් දක්වා තිබුණද නියැදි පරීක්ෂණ අනුව එම වටිනාකම රු.8,791,389 ක් වීම හේතුවෙන් රු.3,438,577 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94 (1) හා අංක 01/2014 හා 2014 ජනවාරි 01 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ 6.4 වගන්තිය ප්‍රකාර බැඳීම ඇති කර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගත යුතු වුවද, එවැනි තහවුරුවකින් තොරව රු.8,217,231 ක බැරකම් වලට බැදී තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, තෝරා ගත් සමාගම් සමඟ වසරක කාලයක් සඳහා මහා භාණ්ඩාගාරය වෙනුවෙන් වාහන මිලදී ගැනීම පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබිය යුතුව තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව එවැනි ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර ගිවිසුමක් වෙනුවට වාහන ලබා ගැනීමේදි ඊට අදාළව බැංකුව සමඟ වෙන වෙනම ගිවිසුම්වලට එළඹ තිබුණි.

(ආ) ඉහත සඳහන් චක්‍රලේඛයේ 03 හා 04 ඡේද අනුව, රාජ්‍ය ආයතනවල ආයතන ප්‍රධානින් තම රේඛිය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව දෙපාර්තමේන්තුවට ඉල්ලුම් පත්‍ර එවූ පසු එම ඉල්ලුම් පත්‍ර අධ්‍යයනය කර ප්‍රමුඛතා ගත කර තෝරා ගත් කල්බදු සමාගම වෙතින් වාහන මිලදී ගැනීමට අනුමැතිය ලබා දිය යුතුව තිබුණි. නමුත් එම රාජ්‍ය ආයතනය අනුමැතිය ලබා දුන් කල්බදු සමාගම වෙතින් අදාළ වාහනය මිලදී ගත යුතු වුවද, එසේ සිදු නොකර දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත්‍ර අනුව අදාළ සමාගම සමඟ වරින්වර ගිවිසුම්වලට එළඹ වාහන මිලදී ගැනිමට කටයුතු කර තිබුණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සඳහා මේ යටතේ ලබා ගත හැකි නිෂ්පාදන හා රේගු බදු රහිත වාහනයක උපරිම වෙළඳපොල මිල රු.මිලියන 4 ක් වුවද, ඊට පටහැනිව එම මිලට වඩා වැඩි වාහන මිලදි ගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

**3.7 කාර්යසාධනය**
**---------------**

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය අනුව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී ගැනීමටත්, වාහන මිලදී ගැනීමෙන් පසුව, නඩත්තු වියදම් අධික පැරණි වාහන ඉවත් කිරීමටත් මෙ චක්‍රලේඛය මගින් අපේක්ෂා කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, මූල්‍ය කල්බදු ක්‍රමය ආරම්භයේ සිට 2016 අප්‍රේල් 30 දින දක්වා වාහන 3958 ක් ලබා ගෙන තිබුණු අතර ඊට අදාල පිරිවැය රු.මිලියන 12,745.51 ක් වූවද, ඉන් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,230.82 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය අනුව, රු.මිලියන 100 ක් හෝ ඊට වැඩි භාණ්ඩ හා සේවා මිලදී ගැනීමකදී, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුවක තීරණය මත සිදු කළ යුතුව තිබුණි. 2010 අගෝස්තු 30 දිනැති අංක BD/GPS/130/9/12 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රාජ්‍ය බැංකු 02 හා ඊට අනුබද්ධිත කල්බදු සමාගම්වලින් පමණක් මිලදී ගැනීමට තීරණය කර තිබුණි.

(ii) ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, නිකුත් කර තිබූ අයවැය චක්‍රලේඛ අංක 150 හි 2 ඡේදය අනුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය බැංකුවකට අනුබද්ධිත ලිසිං සමාගමක් සහ තවත් රාජ්‍ය බැංකුවක් සමඟ සාකච්ඡා කර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.3 මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කර, රජයට වඩාත් වාසිදායක මිල ගණන් හා කොන්දේසි ඉදිරිපත් කරන කල්බදු සමාගම තෝරා ගත යුතු බව සඳහන් වුවද, මෙම මිලදී ගැනීම ඉක්මනින් කළ යුතු බැවින් එම විධිවිධානයන්ද අනුගමනය කර නොතිබුණි. ඒ අනුව මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ හෝ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීම සඳහා හෝ කිසිදු අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(iii) චක්‍රලේඛයෙන් පරිබාහිරව කටයුතු කිරීමට අදාළ අනුමැතින් සම්බන්ධව විමසීමේදී රාජ්‍ය ආයතන සියල්ල සඳහා එකවර වාහන විශාල ප්‍රමාණයක් මිලදී ගැනීම තුළින් ලැබෙන වට්ටම් වාසිය ලබා ගැනීම සඳහා සියළු වාහන අවශ්‍යතා සපුරාලූ බවත් වාහන 50 ට වඩා ලබා ගැනීමේදී වට්ටම් වාසි ලබා දෙන බවත් දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දැනුම් දී තිබුණි. එසේ වුවද , නියැදි පදනම මත ගිවිසුම් පරීක්ෂා කිරීමේදී වාහන 01, 03, 04 ආදි වශයෙන් ගිවිසුම්වලට එළඹ තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඊට අදාළව දෙපාර්තමේන්තුව විසින් ඇණවුම් 02 ක් ලෙස විශාල වාහන ප්‍රමාණයක් ලබා ගැනීම නිසා අඩු කරන ලද මිලට වාහන මිලදී ගෙන ඇති බව විගණනයට දන්වා තිබුණි.

(iv) මුදල් අයකිරීමකින් තොරව වාහන (Free unit) 49 ක් ලැබී තිබුණ අතර එම වාහන රාජ්‍ය ආයතන 22 ක් වෙත ලබා දී ඇති බව විගණනය වෙත දන්වා තිබුණි.

(v) පෞද්ගලික සමාගම් දෙකක් මගින් වාහන ලබා ගැනීමට එකඟ වී තිබුණු අතර එම සමාගම්වලින් ලැබිය යුතු මුළු වට්ටම රු.71,250,000 ක් වී තිබුණු අතර ඒ පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එම සමාගමෙන්ද අඩු කරන ලද මිල ගණන් යටතේ වාහන ලබා ගත් බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(vi) මුලා කල්බදු ක්‍රමය ආරම්භයේ සිට 2016 අප්‍රේල් 30 දින දක්වා වාහන 3958 ක් මිලදී ගෙන තිබුණද, 2015 වර්ෂයේදී ආයතන 172 කට අදාළ වාහන 2668 ක් අපහරණය කළ යුතු බවට හඳුනා ගෙන තිබුණි. එම වාහනවලින් සියයට 16 ක් හෙවත් වාහන 432 කට අදාළ අපහරණයන් සමාලෝචිත වර්ෂයේදී අවසන් කර තිබුණි. මේ අනුව මුලා කල්බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂා කළ වසර 10 කට වඩා පැරණි සහ ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන අපහරණය කිරීමේ ඉලක්කයන් වෙත ළඟා වීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vii) මුලා කල්බදු ක්‍රමය යටතේ වසර 05ක කාලයක් තුළ කල්බදු වාරික ගෙවීමෙන් පසු වාහනේ අයිතිය සම්පූර්ණයෙන්ම කල්බදු ගෙවූ ආයතනයට පැවරෙන බවත් මුලා කල්බදු ක්‍රමය යටතේ මිලදී ගන්නා ලද වාහනවල වටිනාකම ගෙවීම කාලයක් පුරා සිදුවන බැවින් එහි මුල්‍යමය බලපෑම එම කාලය පුරා විසිරී පවතින බවත්, ඒ යටතේ වාහනවල නඩත්තු වියදම කල්බදු ගෙවන්නාට පැවරෙන නමුත් නව වාහන නඩත්තු වියදම් මුල් අවුරුදු 5 තුළදී අවම මට්ටමක පවතින බවත් දන්වමින් 2010 දෙසැම්බර් මාසයේ මුලා කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම නිර්දේශ කර තිබුණද, එම ක්‍රමයේ පවතින දුර්වලතා මගහැරීමටත් රාජ්‍ය ආයතන දරන විශාල නඩත්තු වියදම අඩුකිරීමටත් කල්බදු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමටත් යන අපේක්ෂා ඇතිව 2016 පෙබරවාරි මාසයේදී මෙහෙයුම් කල්බදු ක්‍රමය නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද මෙහෙයුම් කල්බදු ක්‍රමයේදී වාහනයක් සඳහා මාස 60 ක ස්ථාවර කුලී පදනම යටතේ "භාවිතා කර ආපසු භාර දීමේ විකල්පය" මත වාහන ලබා ගෙන ඇති බැවින් වාහනේ අයිතිය කිසිවිටෙකත් රජය සතු නොවන බව නිරීක්ෂණය විය.

(viii) මෙම කල්බදු සඳහා 2010 දෙසැම්බර් 14 වන දින භාණ්ඩාගාර ලේකම්, ජාතික අයවැය දෙපාර්තමේන්තු නිලධාරින් හා රාජ්‍ය බැංකුවක නියෝජිතයන් සමඟ පැවති සාකච්ඡාවේදි මේ සඳහා සියයට 12 ක පොලී අනුපාතයක් අය කරන බවට එකඟ වී තිබුණද, රාජ්‍ය බැංකුවෙන් ලබාගත් තොරතුරු අනුව, එය සියයට 10.5 සිට සියයට 14.5 දක්වා පරාසයක පැවතුණි.

(ආ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුළ ප්‍රතිපාදන සලසා නොමැති විට හෝ පවතින්නා වූ ප්‍රතිපාදන අදාළ කාර්ය සිදු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට පරිපූරක සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ..

(i) 2015 වර්ෂයේදී ඉල්ලීම් 51 ක් සඳහා ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් ඉල්ලීම් 28 ක් සඳහා ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. ඉන් ඉල්ලීම් 8 ක් සඳහා ලබාදුන් ප්‍රතිපාදනවලින් සියයට 35 කට වඩා වැඩි ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ii) මීට අදාළව විගණනයට ඉදිරිපත් කළ ලේඛන අනුව, මේ යටතේ වැය විෂයයන් 06 ක් සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන ඉක්මවා වර්ෂය තුළදී ප්‍රතිපාදනයන් ලබා දී තිබූ අවස්ථා වූ අතර දෙපාර්තමේන්තු කාර්යසාධන වාර්තාවට අනුව, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වෙත වර්ෂය තුළදී රු. මිලියන 271 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබුණත්, වර්ෂය අවසානයේදී තවදුරටත් ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 1,726 ක අධි වැයක් කර තිබුණි.

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 38 | 28 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 75 | 60 | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 38 | 35 | 03 |
| | **එකතුව** | **155** | **125** | **30** |